බුදුසරණ

Buddhist Era 2548 Esala First Quarter - Friday , June 25, 2004



මිහිඳු මහ රහතන් වහන්සේගේ මෑණියන්ගේ ගම් පියස වන වේදිසාවේ ඉදි කර ඇති සර්වඥ ධාතූන් වහන්සේ තැන්පත් කර ඇති චේතියගිරි මහා ස්තූපය

## ඃ බුදුරදුන් වදාළ සැපවත් ජීවිතය

– දේවාලේගම මේධානන්ද හිමි

සැපය පිළිබඳ බෞද්ධ ආකල්පය. බුදුදහම – ජීවිතය තුළ ඇති සැප නොපිළිගන්නා – ඒ තුළ ඇති දුක පමණක් දක්නා – සර්ව අසු–බවාදී දහමක් නොවන බව. ජීවිතය තුළ ඇති විවිධ සැප පිළිබඳ බුදුරදුන් පෙන්වා දී ඇති අයුරු.

## ඃ භාරත සමාජයේ විප්ලවයක් කරමින් බුදුහිමි අනුදැන වදාළ කාන්තා නිදහස

– කිරින්දේ විමලරතන හිමි

බුදුරදුන් පහළවීමට පෙර යුගයේ භාරත සමාජයෙන් කොන්කර තිබූ කාන්තාව තුළ තිබූ සුවිශේෂ කුසලතා ඉස්මතු කොට ඇයට සමාජය තුළ හිමිවිය යුතු නිසිතැන ලබාදීමට බුදුරදුන් ඇති කළ නව චින්තන විප්ලවය හේතු වූ අයුරු.

## ඃ සංකල්පවලින් බැහැර වූ බුදුදහම

– පොතුහැර විපස්සි හිමි

'බුදුදහම' යනු, දර්ශනික මතවාදයක් හෝ සංකල්ප සමූහයක් නොවන බව. බුදුදහම – ලෝක යථාර්ථය පැහැදිලි කරන දහමක් බැවින්, එහි ඇතුළත් ඉගැන්වීම් විස්තර කිරීමේදී 'සංකල්ප' යන භාවිතය යෙදු ගැනීමේ අයෝග්‍යතාව.

## ඃ සුළු සැපත තුළ ඇති අසීමිත දුක

– දිවියාගහ යසස්සි නා හිමි

දහම නොදත් අදූරදර්ශී පෘථග්ජනයා ඉතා මිහිරි යැයි සිතා නියැ–ළෙන පාපයන්ගේ ආදීනවයන්හි බරපතලකම පහද දෙන බුදු වදනකට අර්ථ විවරණයකි, මෙවර 'සාර්ථක ජීවිතයකට ධම්–මපදයෙන්' විශේෂාංගය යටතේ පළවන මෙම කුඩා ලිපියෙන් ඉදිරි–පත් කැරෙන්නේ

## ඃ විකල්ප මතධාරීන් ජයගත යුත්තේ මිතුදමෙන්

– කුරුණෑගොඩ පියතිස්ස නා හිමි

බුදුදහම නොදත් අයට සහ නොදන්නාකමින් එයට එරෙහිව අදහස් පළකරන අයට දහම පහද දිය යුතු නිවැරැදි පිළිවෙත හෙළිදරව් කර ගැනීමට දරන උත්සාහයකි. විකල්ප මතධාරීන් හමුවේ බෞද්–ධයා තුළ තිබිය යුතු සහනශීලී ගුණය මෙම ලිපියෙන් විග්‍රහ කැරේ.

## ඃ දුක හා සැප අතර සරල පැවැත්ම මධ්‍යම ප්‍රතිපදාව නොවේ

– මැදගොඩ අභයතිස්ස හිමි

ආර්ය මාර්ගය හඳුන්වා දෙන 'මජ්ඣිමා පටිපද' යන පාලි වදනට ඇතැම් ධර්ම කථිකයන් ලබාදෙන අදහසක සාවද්‍යතාව පැහැදිලි කරදීම – මෙම ලේඛකයාගේ අරමුණ වී ඇති බව පෙනේ. දුක හා සැප අතර සරල මැදුම් බවක් එයින් අදහස් නොවන බවයි – ලේඛ–කයා මෙම ලිපියෙන් පවසන්නේ.

## ඃ පුද්ගල පාරිශුද්ධියට බුදුදහමෙන් ලැබෙන පිටිවහල

– එම්. ජී. පියසේන

බුදුදහම තුළ පුද්ගල පාරිශුද්ධියට හිමි වන තැන. සසර දුක අවසන් කිරීම සඳහා දහමෙන් නිර්දේශිත වැඩ පිළිවෙළ තුළ – චිත්ත පාරි–ශුද්ධියට හිමිවන ප්‍රමුඛතාව.

## ඃ හපුගොඩ නන්දාරාම නා හිමි

–තාලන්දේ විමලවංශ හිමි

දහම් ගැටලු සහ සංකීර්ණ සමාජ ගැටලු – සරල බසින් විචිත්‍රවත් ලෙස – ධර්මානුකූලව නිරාකරණය කිරීමේ සුවිශේෂ කුසලතාවක් තිබූ වියත් මහ තෙර නමක් අපවත්වී තෙමසක් සපිරෙන මොහොතේ – උන්වහන්සේට උපහාර වශයෙන් පළවන විශේෂ ලිපියකි.

## ඍ සදහම් දැනුම

– වහුමුවේ විජයවංශ නා හිමි
බුදුදහම හා ඊට අදාළ අනෙකුත් විෂය කරුණු පිළිබඳ පාඨකයා දැනුවත් කරන – කෙටි ප්‍රශ්න හා පිළිතුරු ඇතුළත් විශේෂාංගයකි. දහම හදාරන සිසුනට – මෙම විශේෂාංගය – විශේෂයෙන් ප්‍රයෝජනවත් විය හැකිය.

## ඍ ප්‍රාග් බෞද්ධ යුගයේ ලංකාවේ ඇදහිලි සහ විශ්වාස.

– උඩවලවේ මහින්ද හිමි
මිහිඳු මහ රහතන්වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කර – බුදු සසුන මෙහි ස්ථාපනය කිරීමට පෙර ශ්‍රී ලාංකීය සමාජය තුළ පැවැති විවිධ ආගමික ඇදහිලි පිළිබඳ විමර්ශනයකි, මෙම ලිපිය.

## ඍ බෞද්ධ නායකයන් යා යුත්තේ පන්සලට නැතිව පල්ලියට ද?

– කතුවැකිය

## ඍ The meditative mind

*- by Professor Henry Weerasinghe, (Professor of Buddhist Studies, Faculty of Education, University of Colombo)*

## ඍ යොවුන් මවුපියන්ට පින්වත් දරුවන්

– කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි
යහපත් දරුවන් බිහිකළ හැකි යහපත් විවාහ දිවියක් සඳහා ස්වාමි – භාර්යා දෙදෙනා තුළ තිබිය යුතු චරිත ලක්ෂණ. දරුවකු පිළිසිඳ ගත් මවක් ක්‍රියාත්මක කළ යුතු දැහැමි වත් පිළිවෙත්. 'ධම්ම චින්තා' විශේෂංගය යටතේ පළවන කුඩා ලිපියකි.

## ඍ සසර සයුර තරණයට මඟ පෙන්වන චන්දන සූත්‍රය

– ගම්පොළ ඤාණසීහ හිමි
සසර දුකෙන් මිදීම සඳහා පුද්ගලයා විසින් ක්‍රියාත්මක කළ යුතු ප්‍රතිපද මාර්ගය පැහැදිලි කළ සූත්‍ර දේශනාවකට අර්ථ විවරණයකි. යහපත් සිහිය, සීලය, වීර්යය, ප්‍රඥව උපදවා ගැනීමේ වැදගත්කම ආදිය පිළිබඳ විශේෂයෙන් සාකච්ඡා කැරෙන සූත්‍රයකි, මෙය.

## ඍ සුමිත්ත ශ්‍රී සුනන්දාරාම දඩගමුව රාජ මහා විහාරය

– බී. ඩබ්ලිව්. චන්ද්‍රසේකර
ගම්පහ දිස්ත්‍රික්කයට අයත් දඩගමුව නම් වූ සුන්දර ග්‍රාමයේ පිහිටා ඇති ඉපැරණි විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු. සංඝමිත්තා මහ රහත් තෙරණිය සමඟ පැමිණි සුමිත්ත නම් ඇමැතිවරයා විසින් කරවූ ඓතිහාසික විහාරයක් ලෙසයි, මෙය ප්‍රකටව ඇත්තේ.

## ඍ බොදු පුවත්

විශේෂ බෞද්ධ ප්‍රවෘත්ති වාර්තා